**සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය**

**සබරගමුව පළාත් සභාව**

**පුරප්පාඩු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම**

## 1. මධ්‍ය කළමනාකරණ සේවා ගණය - MM 1-1

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප් පරිමාණය |
|---|---|---|
| **සහකාර සාමාන්‍යාධිකාරී(සිවිල්) වාරිමාර්ග - (වරලත් සිවිල් ඉංජිනේරු)** | **02** | MM 1-1 2025 රු.91,690-10x2,480-15x3,450-168,240/= වන අතර කළමනාකරණ සේවා 01/2025 අනුව කටයුතු කරනු ලැබේ. |

### 1.1 සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

**සහකාර සාමාන්‍යාධිකාරී (සිවිල්) වාරිමාර්ග (වරලත් සිවිල් ඉංජිනේරු) (පහත 1හෝ 2 හෝ 3)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
3. සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

**සහකාර සාමාන්‍යාධිකාරී - (සිවිල්)**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

### 1.2 වයස

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 1.3 බඳවාගැනීමේ ක්‍රමය

විවෘත තරඟ විභාගයක් හා /හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.

## 2. කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය MA 2-3

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප් පරිමාණය |
|---|---|---|
| තාක්ෂණ නිලධාරී(සිවිල්) | 6 | MA 2-3 2025 රු.52,700-10x800-11x1,190-10x1,350-100,490/= වන අතර කළමනාකරණ සේවා 01/2025 අනුව කටයුතු කරනු ලැබේ. |
| තාක්ෂණ නිලධාරී(යාන්ත්‍රික) | 1 | |
| ප්‍රමාණ සමීක්ෂක | 2 | |

**2.1. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

**<u>කාර්මික නිලධාරී (සිවිල්) /කාර්මික නිලධාරී (යාන්ත්‍රික)</u>**

(i) තනතුරෙහි කාර්යයභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**<u>ප්‍රමාණ සමීක්ෂක</u>**

(i) තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**2.2 වයස**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**2.3 බඳවාගැනීමේ ක්‍රමවේදය**

ලිඛිත තරඟ විභාගයක හා/හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

## 3. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය PL -3

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප් පරිමාණය |
|---|---|---|
| **මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු** | **02** | PL 3–2025 රු.43,280-10x490-10x540-10x590-12x630-67,040/= වන අතර කළමනාකරණ සේවා 01/2025 අනුව කටයුතු කරනු ලැබේ. |

**3.1 සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :-**

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්ව ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**3.2 වයස**

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**3.3 බඳවාගැනීමේ ක්‍රමවේදය**

තනතුරට අදාළ වන පරිදි වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගැනේ.

## 4. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය - PL 1

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප් පරිමාණය |
|---|---|---|
| සහායක (මුද්‍රණ) | 02 | PL 1–2025 රු.40,500-10x450-10x490-7x540-15x590-62,530/= වන අතර කළමනාකරණ සේවා 01/2025 අනුව කටයුතු කරනු ලැබේ. |

**4.1 සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :-**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

**4.2 වයස් සීමාව**

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**4.3 බඳවාගැනීමේ ක්‍රමවේදය**

වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රථිපල මත බඳවාගැනීම සිදු කෙරේ.

**<u>පොදු කොන්දේසි</u>**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අභ්‍යන්තර අයදුම්කරුවන් යනු **සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ කාර්යය මණ්ඩලය** වේ.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ට නොඅඩු කාලයක් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.(අවම සුදුසුකම් හෝ සපුරාලන අයදුම්කරුවන් නොමැති වුවහොත් අනෙකුත් පළාත් වල අයදුම්පත් සළකා බැලීමට කටයුතු කරනු ලැබේ.)
4. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
5. රජයේ දෙපාර්තමේන්තු හෝ ව්‍යවස්ථාපිත ආයතන වල අපේක්ෂකයින් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.
6. සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර එකී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ශීර්ෂ ආවරණය වන පරිදි ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.(අදාළ අතිරේක පලපුරුද්ද 30,අදාළ අතිරේක අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලකුණු

30, අනෙකුත් කාර්යය සාධනයන් සහ කුසලතා ලකුණු 15,සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය ලකුණු 25)

7. සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ වැටුපෙන් 12% ක් සේවක අර්ථ සාධක අරමුදලට හා 3%ක් සේවක භාරකාර අරමුදලට ආයතනය දායක වන අතර ,සේවකයා සේවක අර්ථ සාධක අරමුදලට 8%ක් දායක විය යුතුය.

8. ඉහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් විසින් සකස් කරන ලද අයදුම්පත් ,ඔවුන්ගේ අධ්‍යාපන වෘත්තීය සහ පළපුරුද්ද සහිත සහතිකවල පිටපත්,ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ එවිය යුතුය.

9. බඳවාගැනීම් හා උසස් කිරීම් පටිපාටියේ අනුමැතියට අනුව අභ්‍යන්තර අපේක්ෂකයින්ටද ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකිය.

10. අයදුම්පත, ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම් කරන ලද තනතුර සළකුණු කර ලියාපදිංචි තැපෑලෙන් හෝ e-mail මඟින් 2026.03.30 දිනට පෙර ලැබෙන සේ යොමු කළ යුතුය.

ලිපිනය - විධායක අධ්‍යක්ෂ, සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය,පැරඩයිස්,කුරුවිට
e-mail – admin@decma.sg.gov.lk

11. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

විධායක අධ්‍යක්ෂ,
සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය,
පැරඩයිස්,
කුරුවිට.